Annex 1

MINISTRY OF FINANCE AND PLANNING

TTIP/PIM/04/03/9-1 2014.03.25

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/(02)/2013

සියළු අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් වෙත,

<u>සහනදායී මෝටර් රථ බලපත්‍ර නිකුත් කිරීම</u>

රාජ්‍ය සේවයෙහි, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි නිලධාරීන් සඳහා සහනදායී මෝටර් රථ බලපත්‍ර නිකුත් කිරීමට අදාළ 2013.08.02 දිනැති වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2013 හි 02.01 (ඇ) වගන්තිය පහත පරිදි සංශෝධනය කෙරේ.

02. කොන්දේසි, නියමයන් හා සහන

02.01 කොන්දේසි හා නියමයන්

(ඇ) මෙම ක්‍රමය යටතේ මෝටර් රථයක් ආනයනයට ණයවර ලිපි විවෘත කළ දින සිට / දේශීයව මිලදී ගන්නා මෝටර් රථයක් සඳහා මුල් ගෙවීම කළ දින සිට වසර 05 ක් ඉක්මවීමට ප්‍රථම වෙනත් පාර්ශවයකට පවරන්නේ නම්, එම පැවරීම ලියාපදිංචි කිරීමේ දී මෙම චක්‍රලේඛයේ 02.01 (අ) 01 හි සඳහන් ෆී.ඊ.ග වටිනාකම මත 10% ක පැවරීම ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් පැවරුම්ලාභියා විසින් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවිය යුතුය.

මෙම නියමය 2014 මාර්තු 26 දින සිට ක්‍රියාත්මක වේ.

පී.බී. ජයසුන්දර
මහා භාණ්ඩාගාරයේ ලේකම් සහ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්

පිටපත්- 01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
04. විගණකාධිපති
05. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගුව
06. කොමසාරිස් ජනරාල්, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
07. කොමසාරිස් ජනරාල්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව